අනුමත කරන ලද අයක්‍රම

අයක්‍රම අනුමැති අංකය : TRC/**M/ST/26/05**

ජංගම පසුගෙවුම් ඒකාබද්ධ පැකේජ සැලසුම්- 2026

පැකේජයේ නම	පැකේජ 01	පැකේජ 02	පැකේජ 03	පැකේජ 04	පැකේජ 05
බිල්පත් කාලසීමාව	මාසික	මාසික	මාසික	මාසික	මාසික
මාසික දායක ගාස්තුව (බදු හැර)	රු.999	රු.1,111	රු.2,222	රු.3,333	රු.4,444
ඕනෑම දේශීය ජාලයකට හඬ ඇමතුම් *	මිනිත්තු 1000	සීමාරහිත	සීමාරහිත	සීමාරහිත	සීමාරහිත
ඕනෑම දේශීය ජාලයකට කෙටි පණිවිඩ (SMS) *	1,000	1,000	1,000	1,000	1,000
ඕනෑම වේලාවක භාවිත කළ හැකි දත්ත ප්‍රමාණය	15GB	25GB	70GB	140GB	300GB
** AI සහ අධ්‍යාපනික යෙදවුම් සඳහා දත්ත ප්‍රමාණයන්	5 GB	10 GB	10 GB	10 GB	20 GB
ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල	රු.999	රු.1,111	රු.2,222	රු.3,333	රු.4,444
පැකේජය වෙනස් කිරීම / උසස් කිරීමේ හැකියාව	ඇත	ඇත	ඇත	ඇත	ඇත

** AI සහ අධ්‍යාපනික යෙදවුම්

චැට්ජීපීටී, ක්ලෝඩ්, කොපයිලට්, ජෙමිනි, කෝසෙරා, කැන්වා, ඇඩෝබි ෆයර්ෆ්ලයි, රෙසියුමේ ජීනියස්, උඩෙමි, ඩීප්සීක් (ChatGPT, Claude, CoPilot, Gemini, Coursera, Canva, Adobe Firefly, Resume Genius, Udemy, DeepSeek) .

01 සිට 05 දක්වා වූ පැකේජ් සඳහා අදාළ කොන්දේසි

පොදු කොන්දේසි

- ඉහත සඳහන් පැකේජ සියලුම පාරිභෝගික (Consumer) සහ ආයතනික (Enterprise) පාරිභෝගිකයින් සඳහා ලබා ගත හැකිය.
- ඉහත 01 සිට 05 දක්වා වූ පැකේජ මාසිකව අලුත් වන (Recurring) පැකේජ වේ.

- 01 සිට 05 දක්වා වූ පැකේජ සඳහා දායක වන පාරිභෝගිකයින්ට, භාවිත නොකළ ඕනෑම වේලාවක භාවිත කළ හැකි දත්ත (Anytime Data) ඊළඟ බිල්පත් චක්‍රය (Billing Cycle) වෙත රැගෙන යාමට (Rollover) හැකිය. මෙසේ රැගෙන යා හැකි උපරිම කාලසීමාව එක් (01) බිල්පත් චක්‍රයකට සීමා වේ. ඊළඟ බිල්පත් චක්‍රයෙන් පසුව ද ඉතිරිව පවතින භාවිත නොකළ දත්ත ස්වයංක්‍රීයව කල් ඉකුත් වේ.
- 01 සිට 05 දක්වා වූ පැකේජ සඳහා දායක වී සිටින පාරිභෝගිකයින්, මිතුරන් සහ පවුලේ සාමාජිකයින් සඳහා පිරිනමනු ලබන වට්ටම් (Friends & Family Discounts) ලබා ගැනීමට හිමිකම් ලබයි. එම පැකේජ සඳහා දායක වී සිටින සාමාජිකයින් දෙදෙනෙකු (02) හෝ ඊට වැඩි පිරිසක් එක්ව මිතුරන් සහ පවුලේ සාමාජිකයින්ගේ කණ්ඩායමක් (Friends & Family Group) පිහිටුවීමට ද හැකියාව ඇත. එවැනි කණ්ඩායමක සිටින සක්‍රීය සාමාජිකයින් සංඛ්‍යාව අනුව, කණ්ඩායමේ සියලුම සාමාජිකයින්ට පහත සඳහන් පරිදි මාසික ගාස්තු සඳහා වට්ටමක් හිමි වේ.

සක්‍රීය සාමාජිකයින් සංඛ්‍යාව	මාසික ගාස්තු වට්ටම (සියලුම සාමාජිකයින් සඳහා අදාළ වේ)
සාමාජිකයින්2	5%
සාමාජිකයින්3-4	8%
සාමාජිකයින් 05 හෝ ඊට වැඩි	10%

02 සිට 05 දක්වා වූ පැකේජ සඳහා දායක වී සිටින පාරිභෝගිකයින්ට, පහත සඳහන් මිල ගණන් යටතේ අතිරේක සම්බන්ධතා (Supplementary Lines) උපරිම වශයෙන් 04ක් දක්වා මිලදී ගත හැකිය.

පැකේජයේ නම	පැකේජ 02	පැකේජ 03	පැකේජ 04	පැකේජ 05
උපරිම අතිරේක සම්බන්ධතා සංඛ්‍යාව	1	2	4	4
එක් අතිරේක සම්බන්ධතාවයක් සඳහා මිල – බදු රහිතව	රු. 700			
එක් අතිරේක සම්බන්ධතාවයක් සඳහා හිමි ප්‍රතිලාභ				
හඬ ඇමතුම් මිනිත්තු	ඕනෑම ජාලයකට සීමා රහිත			
දත්ත ප්‍රමාණය (GB)	15 GB			

*අතිරේක සම්බන්ධතාවයේ (Supplementary Line) අන්තර්ගත දත්ත ප්‍රමාණය (GB), ප්‍රධාන සම්බන්ධතාවයේ (Primary Line) අන්තර්ගත දත්ත ප්‍රමාණය සමඟ ඒකාබද්ධ කර පොදු දත්ත එකතුවක් (Data Pool) ලෙස සකස් කරනු ලබන අතර, එම දත්ත ප්‍රධාන සම්බන්ධතාවය සහ අතිරේක සම්බන්ධතා අතර හුවමාරු කර භාවිත කළ හැකිය.

****AI සහ අධ්‍යාපන යෙදවුම් සඳහා වන දත්ත පැකේජය (App Bundle)**

- App Bundle හි අන්තර්ගත දත්ත ප්‍රමාණය (GB) අවසන් වූ විට, අදාළ යෙදුම් (Apps) සඳහා වැය වන දත්ත ප්‍රමාණය ඕනෑම වේලාවක භාවිත කළ හැකි දත්ත පැකේජයෙන් (Anytime Bundle) අඩු කරනු ලැබේ.
- App Bundle හරහා දත්ත භාවිත කිරීමට අවසර ලබා දෙනුයේ අදාළ යෙදුම්වල වෙබ් අනුවාද (Web Versions) සඳහා පමණි. එම යෙදුම්වල ජංගම දුරකථන යෙදුම් (Mobile Applications) භාවිත කිරීමේදී App Bundle හි දත්ත භාවිත කිරීමට අවසර නොලැබේ.
- දත්ත භාවිතය ප්‍රමිති ගුණාත්මකභාවයට (SD Quality) ගැළපෙන පරිදි සකස් කරනු ලැබේ.

පාරිභෝගිකයින් සඳහා නව සම්බන්ධතා ලබාදීමට අදාළ කොන්දේසි

- එක් ජාතික හැඳුනුම්පතක් (NIC) යටතේ ලබාගත හැකි උපරිම සම්බන්ධතා සංඛ්‍යාව බලාත්මක සම්මත රෙගුලාසි මගින් තීරණය කරනු ලබන අතර, ඒ අනුව එක් පුද්ගලයෙකුට එක් ජාතික හැඳුනුම්පතක් යටතේ උපරිම වශයෙන් සම්බන්ධතා පහක් (05) දක්වා ලබාගත හැකිය.
- පාරිභෝගිකයාගේ තොරතුරු ඇතුළත් කර අයදුම්පත සම්පූර්ණ කළ යුතු අතර, එම අයදුම්පතට පාරිභෝගිකයා විසින්ම අත්සන් තැබිය යුතුය. ඒ සඳහා භෞතික අයදුම්පතක් හෝ ඩිජිටල් ආකාරයෙන් සම්පූර්ණ කර අත්සන් කරන ලද අයදුම්පතක් භාවිත කළ හැකිය.
- නව සම්බන්ධතාවයක් ලබාගැනීමේදී වලංගු ජාතික හැඳුනුම්පතක් (NIC) හෝ රියදුරු බලපත්‍රයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. තවද, බිල්පත් යොමු කළ යුතු ලිපිනය ජාතික හැඳුනුම්පතේ සඳහන් ලිපිනයට වඩා වෙනස් නම්, එම ලිපිනය තහවුරු කිරීම සඳහා ලිපින සාක්ෂියක් (Billing Proof) ඉදිරිපත් කළ යුතුය.

ව්‍යාපාරික ආයතන (Enterprise) සඳහා නව සම්බන්ධතා ලබාදීමට අදාළ කොන්දේසි

- සම්බන්ධතා නිකුත් කළ යුත්තේ අදාළ ව්‍යාපාරික ආයතනයේ ව්‍යාපාර ලියාපදිංචි සහතිකය හෝ එම ආයතනය පිහිටුවනු ලැබූ රජයේ පනත මත පදනම්වය.
- ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සමඟ ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතුය.
- ව්‍යාපාරික ආයතන සහ රජයේ ආයතන වෙත නිකුත් කරනු ලබන සම්බන්ධතා සඳහා තැන්පතු මුදල් (Deposits) අදාළ නොවේ.

නව පැකේජ වෙත මාරු වන දැනට සිටින පාරිභෝගිකයින් සඳහා අදාළ කොන්දේසි

- නව පසු-ගෙවුම් (Postpaid) පැකේජ සඳහා නියම කර ඇති තැන්පතු නිර්ණායක සපුරාලීමට යටත්ව, වෙනත් පසු-ගෙවුම් පැකේජවල සිට යෝජිත පසු-ගෙවුම් පැකේජ වෙත මාරු වීමට පාරිභෝගිකයින්ට අවසර ඇත. කෙසේ වෙතත්, වසර තුනකට (03) වැඩි කාලයක් ජාලය තුළ රැඳී සිටින පාරිභෝගිකයින්, යෝජිත පැකේජය සඳහා නියම කර ඇති මට්ටමට අනුව තැන්පතු මුදල ගෙවීමෙන් හෝ පවතින තැන්පතු මුදල වැඩි කිරීමෙන් නිදහස් වේ.

හඬ (Voice) සහ දත්ත (Data) පැකේජ (Bundle) සම්බන්ධ කොන්දේසි

- පැකේජයට ඇතුළත් ඕනෑම දේශීය ජාලයකට (Any-Net) අදාළ හඬ ඇමතුම් මිනිත්තු ප්‍රමාණය ඉක්මවා භාවිත කිරීමේදී, එක් හඬ ඇමතුම් මිනිත්තුවක් සඳහා රුපියල් 1.50ක ගාස්තුවක් සහ අදාළ බදු අය කරනු ලැබේ.
- පැකේජයට ඇතුළත් ඕනෑම දේශීය ජාලයකට (Any-Net) අදාළ කෙටි පණිවිඩ (SMS) ප්‍රමාණය ඉක්මවා භාවිත කිරීමේදී, එක් දේශීය කෙටි පණිවිඩයක් සඳහා රුපියල් 0.20ක ගාස්තුවක් සහ අදාළ බදු අය කරනු ලැබේ.
- ඕනෑම වේලාවක භාවිත කළ හැකි දත්ත පැකේජය (Anytime Data Bundle) සම්පූර්ණයෙන්ම අවසන් වූ පසු, ඉන් අනතුරුව සිදු කරනු ලබන අතිරේක දත්ත භාවිතය සඳහා මෙගාබයිට් (MB) එකකට රුපියල් 0.30ක ගාස්තුවක් සහ අදාළ බදු අය කරනු ලැබේ. මෙම ගාස්තු අය කිරීම කිලෝබයිට් (KB) 10ක කොටස් වශයෙන් සිදු කරනු ලැබේ.

ජංගම පුළුල් පරාස දත්ත සේවා වේගයන්

සාමාන්‍ය ජාල වේගය	
උඩුගත කිරීමේ වේගය	බාගත කිරීමේ වේගය
1.5Mbps	**4Mbps**

#. රැහැන් රහිත තාක්ෂණයන්හි ස්වභාවය හේතුවෙන්, පරිශීලකයින්ට සැබෑවටම අත්විඳිය හැකි සේවා තත්ත්වය ප්‍රකාශිත සාමාන්‍ය ජාල වේගයන්ගෙන් වෙනස් විය හැකිය. ගුවන්විදුලි තරංගවල තත්ත්වය, භූගෝලීය ලක්ෂණ, සම්ප්‍රේෂණ ස්ථානයේ සිට පවතින දුර, සංඥා ක්ෂය වීම , සේවාව භාවිත කරන වේලාව (උච්ච හෝ සාමාන්‍ය භාවිත කාලසීමාවන්), සංඛ්‍යාත වර්ණාවලියේ පවතින ධාරිතාව, ජාල ආකෘතිය, භාවිත කරන උපාංගයේ ස්වභාවය සහ බාහිර බලපෑම් ඇතුළු විවිධ සාධක මෙම වෙනසට හේතු විය හැකිය. මීට අමතරව, ජාලය ස්ථාපනය කිරීම පිළිබඳ තීරණ ගැනීමේදී අදාළ සේවා සපයන්නාගේ ව්‍යාපාරික යෝග්‍යතාව සම්බන්ධ කරුණු ද සැලකිල්ලට ගනු ලැබේ.

අර්ථ දැක්වීම – දේශීය ජාලය*

- ගාස්තු අය කරනු ලබන සේවාවන් සඳහා භාවිත කරන විශේෂිත කෙටි කේත අංක(Premium Short Codes) වෙත ලබා ගන්නා හඬ ඇමතුම් සහ යොමු කරනු ලබන කෙටි පණිවිඩ (SMS), එසේම SLT සහ Mobitel ඇමතුම් මධ්‍යස්ථාන අංක වෙත ලබා ගන්නා ඇමතුම්, ඕනෑම දේශීය ජාලයක් වෙත ලබා දී ඇති හඬ ඇමතුම් මිනිත්තු පැකේජයට (Any Net Local Voice Minute Bundle) හෝ ඕනෑම දේශීය ජාලයක් සඳහා වන කෙටි පණිවිඩ පැකේජයට (Any Net SMS Bundle) ඇතුළත් නොවේ. අදාළ කෙටි කේත සහ දුරකථන අංක කලින් කලට වෙනස් විය හැකිය.

ගාස්තු අය කරනු ලබන විශේෂිත කෙටි කේත අංක

2222	387	1225	8494	6363	2656	8884	4466	2233	4774
123	333	990	8020	5678	2223	8826	4455	2024	7676
220	249	365	7775	5656	219	8080	4441	2020	7575
2424	243	9966	7770	5566	2343	7799	4111	1233	4777
9393	888	9922	7766	4634	1076	7700	3666	666	2626
2011	444	9696	7722	3883	1062	7323	3399	511	1010
555	9900	9125	7274	3322	880	6661	3334	479	1001
7551	7788	9070	6997	3232	844	5111	3332	456	506
6666	258	8778	6797	3231	369	5100	3040	429	234
777	225	8575	6474	2882	8888	5000	2255	428	

ශ්‍රී ලංකා ටෙලිකොම් සහ මොබිටෙල් ඇමතුම් මධ්‍යස්ථාන අංක

1212
1717